මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2026 නොවැම්බර් 20

මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක. 06 – 2026 නොවැම්බර්

ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25කින් ඉහළ දැමීමට තීරණය කරයි

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය ඊයේ දින පැවති සිය රැස්වීමේ දී, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 9.00%ක් දක්වා පදනම් අංක 25කින් ඉහළ දැමීමට තීරණය කළේය.[1] වෙනස්වන දේශීය සහ ගෝලීය තත්ත්වයන් සහ ඉදිරි දැක්ම පිළිබඳව මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මෙම තීරණයට එළැඹිණි.

මැදපෙරදිග කලාපයේ ගැටුම්කාරී තත්ත්වය අපේක්ෂා කළ කාලයට වඩා දිගු කාලයක් මුළුල්ලේ පවතී. ඉහළ ගිය ගෝලීය බලශක්ති මිල ගණන් සමඟ ඉහළ යමින් පවතින ආහාර මිල ගණන් හේතුවෙන් දේශීය ආර්ථිකය තුළ උද්ධමනකාරී පීඩනයන් උත්සන්න වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය 8.3%ක් දක්වා (වාර්ෂික ලක්ෂ්‍යමය) ඉහළ ගොස් ඇත. ඉහළගිය බලශක්ති සහ ආහාර මිල ගණන්වල වක්‍ර බලපෑම් හේතුවෙන් මූලික උද්ධමනය ද ඉහළ ගියේය. මෑත කාලීනව ගෝලීය බලශක්ති මිල ගණන් යම් ප්‍රමාණයකින් පහළ ගොස් ඇත. කෙසේ වුවද, බලශක්ති මිල ගණන්වල මීට පෙර සිදුවූ ඉහළ යාම් මගින් ඇති කෙරෙන දෙවන වටයේ බලපෑම් හේතුවෙන් නුදුරු කාලීනව මිල මට්ටම් මත පීඩනයන් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. නවතම පුරෝකථනවලට අනුව, උද්ධමනය, නුදුරු කාලීනව පෙර පුරෝකථනය කළ කාලයට වඩා දිගු කාලයක් ඉහළ මට්ටමක පැවතිය හැකි අතර, අනතුරුව 2027 වසරේ දෙවන භාගයේ දී 5%ක ඉලක්කගත මට්ටම කරා නැවත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීන උද්ධමන අපේක්ෂාවන්, උද්ධමන ඉලක්කය වටා ස්ථාවරව පවතින නමුත්, විශේෂයෙන් ඉදිරි වසරක කාලය සඳහා වන උද්ධමන අපේක්ෂාවන් මෑත කාලීනව ඉහළ යාමක් පෙන්නුම් කරයි.

2026 වසරේ මැයි මාසයේ දී සිදු කළ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග වලට සමගාමීව වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගොස් ඇත. පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය වර්ධනයේ වේගය අඛණ්ඩව මන්දගාමී වී ඇති නමුත්, එය තවදුරටත් ඉහළ මට්ටමක පවතී. මේ අතර, ගෝලීය ආර්ථිකයේ පවතින අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද, විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පැවතුණි. රජයේ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුව ද, 2026 වසරේ ඔක්තෝබර් මස අවසානය වනවිට දළ නිල සංචිත එ.ජ.

[1] එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට පදනම් අංක ± 50ක ආන්තිකයකින් සම්බන්ධ කර ඇති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින් 8.50%ක් සහ 9.50%ක් දක්වා වැඩි විය.

ඩොලර් බිලියන 7.1ක්[2] දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා මහ බැංකුව විසින් අඛණ්ඩව විදේශ විනිමය ශුද්ධ පදනම මත මිලදී ගැනීම හේතුවිය. මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියල ද බොහෝ දුරට ස්ථායීව පැවතුණි.

නුදුරු කාලීනව උද්ධමනය තවදුරටත් ඉහළ මට්ටමක පැවතීමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින්, උද්ධමන අපේක්ෂා, උද්ධමන ඉලක්කයෙන් විතැන් වීමේ අවදානම අවම කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කිරීම සුදුසු බව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අදහස විය. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සඳහා ගනු ලැබූ මෙම තීරණය මගින් දේශීය මිල ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ ඇති කැපවීම පෙන්නුම් කරයි.

තවද, නිල සංචිත ගොඩනැගීම සඳහා මහ බැංකුව විසින් සිදුකළ දේශීය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම් හරහා දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. මේ හේතුවෙන්, ඉදිරි කාලපරිච්ඡේදයේ දී ණය වර්ධනයේ අපේක්ෂිත අඩුවීම කිසියම් දුරකට මන්දගාමී විය හැකිය. ඒ අනුව, 2026 දෙසැම්බර් 09 වන දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගැනීමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රතිශතාංක 1කින්, 3.00% දක්වා ඉහළ නැංවීමට ද මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තීරණය කළේය.

මහ බැංකුව දේශීය හා ගෝලීය ප්‍රවණතා පිළිබඳ දත්ත මෙන්ම උද්ගතවන අවදානම් මනාව ඇගයීමට ලක් කරමින් ආර්ථිකයට එහි උපරිම ධාරිතා මට්ටමට ළඟාවීම සඳහා සහාය වන අතර ම, උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථාවර වීම තහවුරු කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත.

2027 වසර සඳහා වන මුදල් ප්‍රතිපත්ති විවරණය පිළිබඳ පළමු නිවේදනය නිකුත් කිරීමට නියමිත දිනය ඉදිරියේ දී ප්‍රකාශයට පත් කෙරේ.

දත්ත ඇමුණුම සඳහා ප්‍රවේශය https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/mpr06_2026_s.pdf


[2] චීන මහජන බැංකුවෙන් හිමි වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද මීට ඇතුළත් වේ.

ඇමුණුම 01:

පහත දක්වා ඇති පුරෝකථන 2026 නොවැම්බර් 19 වැනි දිනට ලැබී ඇති තොරතුරු මත පදනම් වේ. මැදපෙරදිග කලාපයේ පවතින අර්බුදකාරී තත්ත්වයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ එමගින් ගෝලීය සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එල්ලවන පුළුල් වක්‍ර බලපෑම් මෙන්ම එක්සත් ජනපදයේ මධ්‍යවාර මැතිවරණවලින් අනතුරුව වෙනස් වෙමින් පවතින ඵරටප්‍රතිපත්ති ඉදිරි දැක්ම මධ්‍යයේ, වත්මන් උද්ධමන ඉදිරි දැක්ම සඳහා ඉහළ අවිනිශ්චිතතාවක් පවතී. ඒ අනුව, පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් උද්ධමනය මෙම පුරෝකථනවලින් සැලකිය යුතු ලෙස අපගමනයවිය හැකිය.

කාර්තුමය මතුපිට උද්ධමනයේ මූලික පුරෝකථන* (කො.පා.මී.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 නොවැම්බර් මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය: මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

** 2023 ඔක්තෝබර් මාසයේ දී අත්සන් කරන ලද මහ බැංකුව සහ මුදල් අමාත්‍යාවරයා අතර ඇති කරගත් මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ මූලින් එකඟ වූ උද්ධමන ඉලක්කය (5%), *2026 ඔක්තෝබර් මාසයේ අත්සන් කරන ලද නව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ නවදුරටත් පවත්වා ගන්නා ලදී.*

* උද්ධමන ව්‍යාප්ති සටහනෙහි (Fan chart) වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021 = 100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. 2026 නොවැම්බර් මස පුරෝකථන වාරයේ දී පැවති සියලු ම දත්ත මත පුරෝකථන පදනම් වේ.

සටහන : උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කරමින් විදහා දැක්වේ. රූපසටහනෙහි දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දැක්වේ. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේ දී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

***සටහන:* පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**

මෙම පුරෝකථන, 2026 වසරේ නොවැම්බර් මස පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පදනම්ව සිදු කර ඇත. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත ආර්ථික වර්ධනය, රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, විදේශීය ජංගම ගිණුමේ ශේෂය ඇතුළුව විදේශීය අංශයේ අපේක්ෂිත ප්‍රවණතා සහ එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යන කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති සමඟ අනුකූල වන පොලී අනුපාතික මාර්ගය සහ ඒ හා සබැඳි සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය.

භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව නැවතත් තීව්‍ර වීම හෝ දිගුකාලීනව පැවතීම මගින් දේශීය බලශක්ති හා ප්‍රවාහන වියදම් සහ පොහොර මිල ගණන් අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යාමට ඇති හැකියාව; එල් නිනෝ හා සම්බන්ධ අහිතකර කාලගුණික තත්ත්වයන් අපේක්ෂා කළ මට්ටමට වඩා දැඩි වීම හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි බලපෑම් ඇති වීම; අහිතකර වෙළඳපොළ අපේක්ෂා හා බාහිර කම්පන හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණ වීමට ඇති හැකියාව; සහ උද්ධමන අපේක්ෂා ඉලක්කගත මට්ටමෙන් අපගමනය වීමේ හැකියාව වැනි සාධක මගින් උද්ධමන පුරෝකථනවලට වඩා, වාර්තා වන උද්ධමනය ඉහළ යාමේ අවදානම් ඇති විය හැකිය. මේ අතර, වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා පහළ යෑමේ අවදානම් සැලකූ විට, ආනයනික උද්ධමනය සහ දේශීය බලශක්ති හා ප්‍රවාහන වියදම් අඩු වීමට බලපෑම් ඇති කළ හැකි ගෝලීය බලශක්ති සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් අපේක්ෂා කළ මට්ටමට වඩා පහළ යාම; සහ එල් නිනෝ තත්ත්වයන් නිසා ඇති වන බලපෑම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු වීමට ඇති හැකියාව ඇතුළත් වේ.